රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2018.08.14

# ප්‍රවෘත්ති නිවේදනය

**සාමය සංහිඳියාව ඉලක්ක කරගත් “අහන්න” වැඩසටහන තවදුරටත් ග්‍රාමීය මට්ටම දක්වා ගෙන යන්නැයි ජනතාව ඉල්ලති**

සංහිඳියාව සහ සහජීවනය තුළින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීම ඉලක්ක කරගෙන ප්‍රාදේශීය මට්ටමින් ජනතාව දැනුවත් කර ජාති ආගම් කිසිදු භේදයකින් තොරව එකම රටක් එකම ජාතියක් ලෙස ජනතාව අතර ජාතික සංහිඳියාව ගොඩනැගීම සඳහා රජය ආරම්භ කර ඇති වැඩපිළිවෙළ ග්‍රාමීය මට්ටම දක්වා ගෙන යමින් ජනතාව අතර සහජීවනය ගොඩනැගීමට කටයුතු කරන්නැයි ඊයේ (2018.08.13) කෑගල්ල නගරයේ පැවති “අහන්න” වැඩසටහනට සහභාගි වූ ජනතාව සංවිධායකයින්ගෙන් ඉල්ලා සිටිති.

දීප ව්‍යාප්තව දිවයින පුරා පැවැත්වීමට කටයුතු යොදා ඇති මෙම වැඩසටහනේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ආරම්භක වැඩසටහන කෑගල්ල නගරයේ පොළ ආශ්‍රිතව අද පැවති අතර ඉදිරියේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ම ආවරණය වන පරිදි පැවැත්වීමට නියමිතය. අද පැවති මෙම “අහන්න” වැඩසටහන සඳහා සම්පත්දායකයින් ලෙස නිදහසේ වේදිකාව සංවිධායක ප්‍රසංග ප්‍රනාන්දු, නිදහසේ වේදිකාවේ සමාජික සනත් පතිරණ යන මහත්වරුන් සහභාගි වූහ.

අම්බලන්ගොඩ මහාචෛතිය පිරිවෙනේදී ඊයේ (13) තවත් “අහන්න” වැඩසටහනක් පැවති අතර එහි සම්පත්දායකයින් ලෙස එකම දැයක් වෙනුවෙන් වෘත්තකයන්ගේ එකමුතුවේ විධායක සභික චමින්ද ගුණසිංහ, නිදහසේ වේදිකාව මෙහෙයුම් කමිටු සාමාජික, සංක්‍රාන්ති යුක්තිය හා ජාතික සංහිඳියාව සඳහා කාර්ය සාධක බලකායේ ඌව පළාත් සම්බන්ධීකාරක නඩේෂන් සුරේෂ් හා ජාතික ඒකාබද්ධතා, සහජීවන හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ ජාතික ඒකාබද්ධ නිලධාරී සුදර්ශන විදානපතිරණ යන මහත්වරුන් එක්ව සිටියහ.

වැඩසටහන් පැවැත් වූ ප්‍රදේශවල ප්‍රජා පොලිස් ඒකක, සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, ජාතික තරුණ සේවා සභාව එක්ව මෙම වැඩසටහන සංවිධාන කෙරේ.

ආගමික නායකයින්, පොලිස් නිලධාරීන් ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවන් සඳහා එක්ව සිටියහ.

**ඩබ්.එම්. ශාන්තප්‍රිය**
අංශ ප්‍රධානී (ප්‍රචාරක අංශය)
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට